## 1:2 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර හා පරමාර්ථ

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**
**Excise Department of Sri Lanka**

*" වගකීමෙන් සුරක්ෂාවට "*
***" Protection through responsibility "***

### දැක්ම

මත්පැන් හා දුම්කොළ කර්මාන්තය විධිමත්ව නියාමනය කිරීම තුළින් රාජ්‍ය ආදායම වර්ධනය කිරීම සඳහා කැප වූ වඩාත්ම ගෞරවනීය හා වගකිව යුතු රාජ්‍ය ආයතනය වීම.

### මෙහෙවර

නීත්‍යානුකූල වෙළඳ ආදායම් උත්පාදනය සඳහා පහසුකම් සැලසීම තුළින් ද , ක්‍රියාත්මක කල හැකි සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම බලාත්මක කිරීම තුලින්ද , නීති විරෝධී
මත්පැන්, අන්තරායකර ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය අනිසි භාවිතයට එරෙහිව තියුණු දැනුවත් කිරීමේ වැඩසටහන් ඇති කිරීම තුළින් ද ප්‍රමිතියකට අනුකූල නොවූ මද්‍යසාර භාවිතය මගින් සිදුවන සෞඛ්‍ය උපද්‍රවයන්ගෙන් ආරක්ෂාව සහතික කිරීම තුළින් ද ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට සහය වීම සඳහා රට තුළ මත්පැන් සහ අනෙකුත් අනුමත මද්‍යසාර කාර්යක්ෂමව හා සඵලදායී ලෙස පරිපාලනය කිරීම.

## පරමාර්ථ

- උපායමාර්ගික, මෙහෙයුම් සහ උපායික මට්ටම්වලදී ඵලදායි තීරණ ගැනීමට සහාය වීම සඳහා ආයතනික දර්ශනයක් ලෙස අනුකූලතාවය වැඩි දියුණු කිරීම සහ අවදානම් කළමනාකරණය කිරීම තුළින් ආදායම් එකතු කිරීම උපරිම කිරීම.

- ආදායම උපරිම කර ගැනීම අරමුණු කරගත් දැනුම අඛණ්ඩව හුවමාරුකර ගැනීම මගින් අදාළ නීතිවලට පාර්ශවකරුවන්ගේ අනුකූලතාවය ඉහළ නැංවීම තුළින් වෙළඳාම සඳහා පහසුකම් සැපයීම.

- මත්පැන් සහ දුම්කොළ ආදායම පාලනය කිරීම සහ පහසුකම් සැපයීම අතර ඇති සමතුලිතතාවය ලගා කර ගැනීම සඳහා මූලික වන අවදානම් කළමනාකරණ මූලධර්ම ඵලදායී ලෙස යෙදීම.

- සුරාබදු එකතු කිරිමේදී අවංකභාවය සහ කාර්යක්ෂමතාවය කෙරෙහි මහජන විශ්වාසය පවත්වා ගෙනයාම.

- මත්පැන් නිෂ්පාදනය හා විකිණීම, පරිපාක ස්ප්‍රීතු, ස්වභාවය වෙනස් කල ස්ප්‍රීතු සහ වෙනත් අනුමත මත්ද්‍රව්‍ය නියාමනය කිරීම.

- නීතිවිරෝධී මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහිව තිරසාර මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ දැනුවත් කිරීම් සිදු කිරීම.
- නීති විරෝධී ස්ප්‍රීතු ආසවනය හා බලපත්‍ර රහිතව රහසිගතව සිදු කරන ස්ප්‍රීතු ආසවනය වැළැක්වීමට නීති, රීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

- අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය තුළින් ප්‍රමාණවත් වෘත්තීය හා තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සිටින බව සහතික කිරීම සඳහා සේවකයින්ගේ හැකියාවන් සහ ධාරිතාවය වර්ධනය කිරීම.

- උපරිම තෘප්තිමත්භාවයකින් හා මනා පුහුණුවකින් යුතුව සේවයට කැපවුණ කාර්යය මණ්ඩලයක් පවත්වා ගෙන යාම.

- මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීම වැළැක්වීම.

- විෂ මත්ද්‍රව්‍ය හා විෂ මත්පැන් වෙළඳාම පිටු දැකීමට කටයුතු කිරිම හා ඒවා භාවිතයෙන් මහජනයා ආරක්ෂා කර ගැනිම.

- මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් බාහිර ආයතන සමඟ මනා සම්බන්ධතාවයකින් සහ කාර්යක්ෂම බදු ක්‍රමයක් පවත්වා ගෙන යාම.

## කාර්යයන් හා අගයයන්

### කාර්යයන්

- සුරාබදු බලපත්‍රලාභී සියලුම පරිශ්‍රයන් අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ඉන් ලැබෙන ආදායම් එකතු කිරීම.
- සුරාබදු ආඥාපනත , දුම්කොළ බදු පනත කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.
- වස විෂ, අබිං හා අන්තරාදායක ඖෂධ ආඥාපනත සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.
- ජාතියේ සමාජ ආරක්ෂාව සඳහා ජාතික දුම්කොළ සහ මද්‍යසාර අධිකාරිය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ පොලිස්, රේගු හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැනි වෙනත් නීති ක්‍රියාත්මක කරන ආයතන සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම.
- නීති විරෝධී මත්පැන් හා මත්ද්‍රව්‍යවලට එරෙහිව ආයතනික වැඩසටහන් හරහා දැනුවත් කිරීම හා නීති විරෝධී මත්පැන් හා අන්තරායකර ඖෂධවල හානිය පිළිබඳ සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීම.
- 2008 අංක 01 දරණ මත්ද්‍රව්‍ය හා මනෝවර්තක මත්ද්‍රව්‍යවල නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීම.
- සැලසුම් කල වර්ෂය තුළ සියලුම මට්ටමේ සේවකයන් සඳහා පුහුණුව ලබා දීම.
- රැස්වීම්, සාකච්ඡා සඳහා සියලුම පාර්ශවකරුවන් සමඟ ක්‍රියාකාරී සහභාගිත්වය.

### අගයයන්

- සැමට එකලෙස සලකන මිත්‍රශීලි හා විනිවිද භාවයෙන් යුතු සේවා ලබා දිමේ සංස්කෘතියක් පවත්වා ගෙන යාම.
- අවසන් ඉලක්කය දක්වා ගමන් කල හැකි කණ්ඩායම් හැඟීමෙන් යුතු කැපවුණු කාර්යය මණ්ඩලයක් සිටීම.
- සුරක්ෂිත අනාගතයක් සඳහා දරු පරපුරට නිසි මග පෙන්වීම අරමුණු කරගත් නීති විරෝධී මද්‍යසාර, මත්ද්‍රව්‍ය තුරන් කිරීමට කටයුතු කිරීම.
- මනුෂ්‍ය වටිනාකම් අගය කරනු ලබන පුද්ගලයෙකු සමාජ ගත කිරීම.
- විධිමත් උපාය මාර්ගික සැලස්මක් තුළ කටයුතු කිරීම.
- නව තාක්ෂණ ක්‍රමවේද තුළින් සේවාලාභීන්ට කාර්යක්ෂම හා උපරිම සේවාවක් ලබා දීම.
- නවීන තාක්ෂණය මගින් නිවැරදි බදු එකතු කිරීම.
- මනා විශ්වාසයකින් යුත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- විෂ මත්ද්‍රව්‍ය හා විෂ මත්පැන් භාවිතය අවම කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- බාහිර ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම.